ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව |
| දිනය | 2017.07.12 |

## "Ceylon Tea" 150 වන සංවත්සරය සැමරීම වෙනුවෙන් සමරු කාසියක් නිකුත් කිරීම.

"Ceylon Tea", ශ්‍රී ලංකාවේ ඉතා වැදගත් සහ දිගු කාලීන අපනයනික වෙළඳ භාණ්ඩයක් ලෙස ජාතික ආර්ථිකයට සිදුකරනලද දායකත්වය සලකා එහි 150 වන සංවත්සරය සැමරීම වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුහුණත වටිනාකම රු. 10 ක් වන සමරු කාසියක් නිකුත් කරන ලදී.

මෙහි පළමු කාසි කාණ්ඩය 2017.07.12 දින ශ්‍රී ලංකා මහ බැංකු පරිශ්‍රයේ පැවති උත්සවයේදී ශ්‍රී ලංකා මහ බැංකු අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා විසින් ගරු මුදල් අමාත්‍ය මංගල සමරවීර සහ ගරු වැවිලි කර්මාන්ත අමාත්‍ය නවීන් දිසානායක යන මහත්වරුන් වෙත නිල වශයෙන් පිළිගන්වන ලදී.

මෙම සමරු කාසිය 2017.07.13 දින සිට බලපත්‍රලාභී වාණිජ බැංකු හරහා සංසරණයට නිකුත් කරනු ලබන අතර සංසරණයේ පවතින අනෙකුත් ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි අතරෙහි ගෙවීම් සඳහා භාවිතා කළ හැකි වේ.

<u>**කාසිය පිළිබඳ විස්තර**</u>

### කාසියේ මුහුණත




ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ බුද්ධිමය දේපලක් ලෙස ගැසට් කරනලද "Ceylon Tea - ගුණාත්මකභාවයේ සංකේතය" නිරූපණය කරනු ලබන සළකුණ වන සිංහයා නිල ලාංඡනය කාසියේ කේන්ද්‍රයේ දැක්වේ. 1867 වර්ෂයේ අරඹනලද ශ්‍රී ලංකාවේ (මීට පෙරාතුව සිලෝන්) තේ කර්මාන්තය වර්ෂ 2017 දී වසර 150ක් සපිරීම පෙන්නුම් කරමින් කාසියේ පරිධිය සමලංකෘත කරන ලදී. ඉතා කදිම “Ceylon Tea” නිෂ්පාදනය තහවුරු කරන ඉහළ දලු ප්‍රමිතිය පිළිබඳ සැලකරමින් 'දල පත්‍ර දෙකක සහ අංකුරයක' රූප මඟින් නිල ලාංඡනය දෙපස අනුපූරණය කරන ලදී. “Ceylon Tea” සඳහා වසර 150 ක් සපිරීම සැමරීමට මෙම කාසිය නිකුත් කරන ලද බව පරිධියේ පහළ කොටසින් නිරූපණය කරයි.

### කාසියේ පිටුපස




කාසියේ මුහුණත වටිනාකම වන "10" විශාල ඉලක්කම් වලින් සහ වටිනාකම වචනයෙන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් කාසිය මධ්‍යයේ දැක්වේ. කාසියේ පහළ 2017 වර්ෂය යන්න දැක්වේ. කාසියේ පහළින් ඇති වී කරල් දෙකක් සමඟ රටේ නම දෙමළ, සිංහල හා ඉංග්‍රීසි භාෂා වලින් කාසියේ පරිධියේ දැක්වේ.

## පිරිවිතරයන්:

| | |
|---|---|
| මුහුණත වටිනාකම | රු.10 |
| කාසි ආකාරය | සංසරණ ප්‍රමිතිය |
| නිකුතුව | කාසි 5,000,000 |
| ලෝහය | මල නොබැඳීන වානේ - AISI 430 |
| විෂ්කම්භය | මි.මී. 26.40 |
| ඝනකම | මි.මී. 2.30 |
| හැඩය | කට්ට 11 ක් සහිත |
| දාරය | පැතලි |

## වැඩි විස්තර සඳහා;


ශ්‍රී ලංකා මහ බැංකුව : දුරකථන අංක : 0114387405/ 0112477354

විද්‍යුත් තැපැල : currency@cbsl.lk

ශ්‍රී ලංකා තේ මණ්ඩලය : දුරකථන අංක : 0112587814/ 0112587341

විද්‍යුත් තැපැල : promotion@pureceylontea.com

අධිකාරී

ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

නො. 30, ජනාධිපති මාවත

කොළඹ 1

ශ්‍රී ලංකාව